ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2017/27 - 2017 මැයි මස 03 වැනි බදාදා - 2017.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

27 අ වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මාගේ මේ නියමය මගින් -

(අ) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත මගින් පිහිටුවන ලද රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා දී ඇත්තා වූ ද, මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති නිව්චැට්ල් වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම හා සම්බන්ධ 1994 අප්‍රේල් 21 වැනි දින අංක 815/10 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද එකී ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පවරා දෙන ලද නිව්චැට්ල් වත්ත යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන ඉඩම් කොටසක් වන්නා වූ මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නිව්චැට්ල් වත්ත නැමැති බිම් ප්‍රමාණයට අදාළ වන්නා වූ නියමයේ කොටස කර්මාන්ත හා තාක්ෂණ සංවර්ධන අධි කලාපයක් පිහිටුවීම හේතුවෙන් එකී නියමයන් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම මගින් එම නියම මෙයින් සංශෝධනය කරමි.

(ආ) මෙකී ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමෙන් පසුව මෙහි දෙවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති එකී ඉඩමේ බිම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත සතු කර දෙන බවට මෙයින් ප්‍රකාශ කරමි.

ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2017 ක් වූ මැයි මස 03 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල් වත්ත පටුමග, බත්තරමුල්ල.

**පළමුවන උපලේඛනය**

රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරා දී ඇති නිව්චැට්ල් වත්ත නම් ඉඩමේ විස්තර.

| *ගැසට් නිවේදනයේ විස්තර* | *ඉඩමේ නම* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරන ලද ඉඩම් ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1994.04.21 දින අංක 815/10 | නිව්චැට්ල් වත්ත | කළුතර | මිල්ලනිය | හෙක් : 876. |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**දෙවන උපලේඛනය**

කොමිසන් සභාව වෙත නැවත පැවරෙන ඉඩම් කොටසේ විස්තර

| වෙන්කර දී ඇති විශේෂ අංකය | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පළමු වන උපලේඛනයේ සඳහන් සම්පූර්ණ ඉඩමෙන් කොමිසන් සභාව වෙත පැවරෙන ඉඩම් කොටස |
|---|---|---|---|---|
| කො/529 | නිව්වැට්ල් වත්ත | කළුතර | මිල්ලනිය | බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාතකඩ ගමේ පිහිටි නිව්වැට්ල් වත්ත ඉඩමේ රජයේ මිනින්දෝරු එච්. එස්. කේ. දසනායක මහතා විසින් මැන සකස් කරන ලද අනුරේඛන අංක KA/MILL/2016/705 අනුරේඛනය අනුව,<br><br>කැබලි අංක A මගින් පෙන්නුම් කර ඇති අක් : 10 රූ : 0 පර් : 18.23 කින් යුත් (හෙක් : 4.0930) බිම් ප්‍රමාණයට මායිම් -<br><br>*උතුරට* :- දුලිප් හතුරුසිංහ, ප්‍රදීප් සිල්වා සහ නිමල් ගුණතිලක හිමිකම් කියන නම නොදන්නා කුඹුර (හි.පි. 221816 සහ හි.පි. 208265)<br><br>*නැගෙනහිරට* :- දුලිප් හතුරුසිංහ, ප්‍රදීප් සිල්වා සහ නිමල් ගුණතිලක හිමිකම් කියන නම නොදන්නා කුඹුර (හි.පි. 221816 සහ හි.පි. 208265) සහ කැබලි අංක F, E, B සහ M.<br><br>*දකුණට* :- කැබලි අංක F, E, B සහ M හා මාර්ගය.<br><br>*බටහිරට* :- වීරසිංහ ඥානවතී හිමිකම් කියන කුරන්ඩි වත්ත, මුණසිංහ දයානන්ද සොයිසා සහ තවත් අය හිමිකම් කියන නම නොදන්නා මුඩුබිම, හතුරුසිංහ නන්දසිරි හිමිකම් කියන රබර් සහ කුරුඳු ඉඩම්, හිමිකම් කියන්නා සොයාගත නොහැකි කජුවත්ත කුඹුර සහ ආනන්ද වීරකෝන්, කරුණාමුනි සිරිසේන සහ තවත් අය හිමිකම් කියන දියකුඩළු විල කුඹුර (හි.පි. 221816, හි.පි. 93032, හි.පි. 93030 සහ හි.පි. 208096) |
| | | | | කැබලි අංක B මගින් පෙන්නුම් කර ඇති අක් : 1 රූ : 3 පර් : 18.77 කින් යුත් (හෙක් : 0.7557) වතුපාර. |
| | | | | කැබලි අංක C මගින් පෙන්නුම් කර ඇති අක් : 61 රූ : 1 පර් : 28.84 කින් යුත් (හෙක් : 24.8599) බිම් ප්‍රමාණයට මායිම් -<br><br>*උතුරට* :- කැබලි අංක B<br>*නැගෙනහිරට* :- කැබලි අංක B, E, D සහ H<br>*දකුණට* :- කැබලි අංක B<br>*බටහිරට* :- කැබලි අංක B. |
| | | | | කැබලි අංක G මගින් පෙන්නුම් කර ඇති අක් : 0 රූ : 0 පර් : 4.88 කින් යුත් (හෙක් : 0.0123) පාර. |
| | | | | කැබලි අංක H මගින් පෙන්නුම් කර ඇති අක් : 1 රූ : 3 පර් : 6.31 කින් යුත් (හෙක් : 0.7242) බිම් ප්‍රමාණයට මායිම් -<br><br>*උතුරට* :- කැබලි අංක B, E සහ G. |

දෙවන උපලේඛනය (සම්බන්ධිතයි)

| වෙන්කර දී ඇති විශේෂ අංකය | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පළමු වන උපලේඛනයේ සඳහන් සම්පූර්ණ ඉඩමෙන් කොමිසන් සභාව වෙත පැවරෙන ඉඩම් කෙටස |
|---|---|---|---|---|
| | | | | *නැගෙනහිරට* :- කැබලි අංක E, G, ජී. පත්මසිරි ජී. ජයසිරි හිමිකම් කියන නම නොදන්නා ඕවිට (හි.පි. 221816 සහ හි.පි. 173481)<br>*දකුණට* :- ජී. පත්මසිරි සහ ජී. ජයසිරි හිමිකම් කියන නම නොදන්නා ඕවිට (හි.පි. 221816 සහ හි.පි. 173481 සහ කැබලි අංක J.)<br>*බටහිරට* :- කැබලි අංක J සහ B. |
| | | | | කැබලි අංක J මගින් පෙන්නුම් කර ඇති අක් : 05 රූ : 0 පර් : 0.57 කින් යුත් (හෙක් : 2.0249)<br><br>*උතුරට* :- කැබලි අංක B, J.<br>*නැගෙනහිරට* :- කැබලි අංක J, ජී. ජයසිරි හිමිකම් කියන නම නොදන්නා ඕවිට සහ නිහාල් සමන්ත හිමිකම් කියන නම නොදන්නා ඉඩම. (හි.පි. 221816 සහ හි.පි. 173481)<br>*දකුණට* :- නිහාල් සමන්ත හිමිකම් කියන නම නොදන්නා ඉඩම (හි.පි. 173481 සහ මාර්ගය (ප.මා.සං.අ.))<br>*බටහිරට* :- කැබලි අංක L සහ B. |
| | | | | කැබලි අංක K මගින් පෙන්නුම් කර ඇති අක් : 01 රූ : 2 පර් : 22.39 කින් යුත් (හෙක් : 0.6637) බිම් ප්‍රමාණයට මායිම් -<br>*උතුරට* :- කැබලි අංක B.<br>*නැගෙනහිරට* :- කැබලි අංක K.<br>*දකුණට* :- කැබලි අංක K සහ මාර්ගය (ප.මා.සං.අ.)<br>*බටහිරට* :- මාර්ගය (ප.මා.සං.අ.) සහ කැබලි අංක B. |
| | | | | ඉහත ඉඩමේ රජයේ මිනින්දෝරු එච්. එස්. කේ. දසනායක මහතා මැන සකස් කරන ලද අනුරේඛන අංක KA/MILL/16/734 අනුරේඛනය අනුව,<br>කැබලි අංක N මගින් පෙන්නුම් කර ඇති අක් : 04 රූ : 2 පර්: 7.75 කින් යුත් (හෙක් : 1.8407) බිම් ප්‍රමාණයට මායිම් -<br>*උතුරට* :- මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය)<br>*නැගෙනහිරට* :- හිමිකම් කියන්නා සහ ඉඩමේ නම නොදන්නා ඉඩම කැබලි අංක P සහ ඇළ<br>*දකුණට* :- කැබලි අංක P, වයි. ඩී. ශාන්ත සහ තවත් අය හිමිකම් කියන නම නොදන්නා ඉඩම, ඇළ සහ මාර්ගය<br>*බටහිරට* :- මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) |
| | | | | කැබලි අංක Q මගින් පෙන්නුම් කර ඇති අක් : 00 රූ : 0 පර් : 23.35 කින් යුත් (හෙක් : 0.0591) බිම් ප්‍රමාණයට මායිම් -<br>*උතුරට* :- මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ මාර්ගය.<br>*නැගෙනහිරට* :- මාර්ගය සහ ඇළ.<br>*දකුණට* :- ඇළ.<br>*බටහිරට* :- ඇළ සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය. |

*දෙවන උපලේඛනය (සම්බන්ධිතයි)*

| *වෙන්කර දී ඇති විශේෂ අංකය* | *ඉඩමේ නම* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *පළමු වන උපලේඛනයේ සඳහන් සම්පූර්ණ ඉඩමෙන් කොමිසන් සභාව වෙත පැවරෙන ඉඩම් කෙටස* |
|---|---|---|---|---|
| | | | | කැබලි අංක R මගින් පෙන්නුම් කර ඇති අක් : 00 රූ : 1 පර් : 33.92 කින් යුත් (හෙක් : 0.1870) බිම් ප්‍රමාණයට මායිම් -<br>*උතුරට* :- මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ ඇළ.<br>*නැගෙනහිරට* :- ඇළ සහ සංජීව කුලතිලක හිමිකම් කියන නම නොදන්නා ඉඩම (හි.පි. 112698)<br>*දකුණට* :- ඇළ, සංජීව කුලතිලක හිමිකම් කියන නම නොදන්නා ඉඩම (හි.පි. 112698) සහ මාර්ගය.<br>*බටහිරට* :- මාර්ගය සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය).<br><br>කැබලි අංක S මගින් පෙන්නුම් කර ඇති අක් : 00 රූ : 0 පර් : 28.80 කින් යුත් (හෙක් : 0.0728) බිම් ප්‍රමාණයට මායිම් -<br><br>*උතුරට* :- මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ මාර්ගය.<br>*නැගෙනහිරට* :- මාර්ගය සහ සංජීව කුලතිලක හිමිකම් කියන නම නොදන්නා ඉඩම (හි.පි. 112698)<br>*දකුණට* :- සංජීව කුලතිලක හිමිකම් කියන නම නොදන්නා ඉඩම.<br>*බටහිරට* :- මාර්ගය සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය). |
| | | | | කැබලි අංක T මගින් පෙන්නුම් කර ඇති අක් : 01 රූ : 3 පර් : 06.06 කින් යුත් (හෙක් : 0.7235) බිම් ප්‍රමාණයට මායිම් -<br>*උතුරට* :- මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ මාර්ගය.<br>*නැගෙනහිරට* :- මාර්ගය සහ එන්. ජේ. වීරසේකර හිමිකම් කියන නම නොදන්නා ඉඩම, නන්දාවතී අමරසේකර, ආනන්ද වීරකෝන්, කේ. ජී. සිල්වා සහ තවත් අය කේ. චාලට් සිල්වා හිමිකම් කියන මගුරුවෙල වතුරාන (හි.පි. 112698) සහ මු.පි.ක. 2160 කැබලි අංක 1 සහ 5.<br>*දකුණට* :- එන්. ජේ. වීරසේකර හිමිකම් කියන නම නොදන්නා ඉඩම නන්දාවතී අමරසේකර, ආනන්ද අමරසේකර, කේ. පී. සිල්වා සහ තවත් අය කේ. චාලට් සිල්වා හිමිකම් කියන මගුරුවෙල වතුරාන (හි.පි. 112698) මු.පි.ක 2160 හි කැබලි අංක 1 සහ 5 සහ මාර්ගය. (මාර්ග සංවර්ධන අධිකාරිය).<br>*බටහිරට* :- මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය). |

05 - 498

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.